ලක්රුහුණු මාසික දහම් පත්‍රය

අමා ගගුල May

පෝද උපෝසතය ආයජී

උපෝසතය කර ගනිමු.



ශ්‍රී. බු. ව. 2559 ක්වූ වෙසක් මස කලාපය, රා. ව. 2015 ක් වූ මැයි මස 03 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# පෝද උපෝසතය ආයජී උපෝසතය කර ගනිමු.

(අංගුත්තර නිකාය තික නිපාතය ඇසුරෙනි )

ධම්කාමී සත්පුරුෂයෙනි,

අද වෙසක් පුර පසළොස්වක පෝය දිනයයි. මහබෝසතුන් මවු කුසින් බිහිවීම, ලොව්තුරා බුදධ රාජ්‍යත්වයට පත්වීම, පිරිනිවීම, බුදධත්වයෙන් පසු කිඹුල්වත්පුරට වැඩම වීම. යමා මහ පෙළහර පෑම. තුන්වෙනි වරට ලංකාවට වැඩමවීම සිරිපා සටහන පිහිටුවීම ධර්මාශෝක රජුගේ නියමයෙන් දෙවනපෑතිස් රජු දෙවෙනි වරට අභිෂේක කිරීම. දුටුගැමුණු රජු රුවන්වැලි මහා සෑ රජුන්ගේ වැඩ ආරම්භ කිරීම වැනි අසහාය කරනු සිහිපත් කිරීමත් භාග්‍යවතුන්වහන්සේගේ අප්‍රමාණ ගුණ සිහිපත් කොට ලෝකවාසී බෞද්ධ ජනතාව ආමිස ප්‍රතිපත්ති පූජා පැවැත්වීම සිදුකරන උතුම් දිනයයි.

අද එවැනි උතුම් දිනයේදී ප්‍රතිපත්ති පූජාවට මුල් තැන දෙමින් ක්‍රියාකරන ඔබට ඉතාවැදගත් දහම් පණිවුඩයක් අඩංගු ශ්‍රී මුඛ දේශනාවක් මෙම සදහම් පණිවුඩයට මාතෘකා කර ගතිමි. මේ සූත්‍රය, සූත්‍ර පිටකයේ අඟොත් සඟියෙහි තික නිපාතයේ මහාවග්ගයෙහි දසවෙනි සූත්‍රයයි. සැවැත්නුවර විශාඛා මහ උපාසිකාව විසින් කරවපු පුර්වාරාමයෙහි බුදුරජාණන් වහන්සේ වැඩසිටියදී මිගාර මාතා නම්වූ විශාඛාව එක්තරා පොහොය දිනයකදී භාග්‍යවතුන් වහන්සේ වෙතට ඇවිත් බුදුහිමියන්ට වන්දනා කරල එකත්පසෙක සිටියේය. බුදුහිමියන් විමසනව විශාඛාවෙනි, මේ දහවල් කොහේ යන ගමන්ද? සවාමීනි මම අද පෝය දවස නිසා උපෝසතයෙහි යෙදෙනව. උපවාස කරනව. යනුවෙන් එවිට බුදුහිමියන් පවසනවා.විශාඛාවෙනි, උපෝසත තුනක් පවතිනව

1. ගෝපාලක උපෝසතය 2. නිගණ්ඨුපෝසතය 3. අරියුපෝසතයයි

එදා පෝය දවසක් නිසා විශාඛා උපාසිකාවද එදින උපවාසයේ යෙදී සිටි නිසා බුදුරජාණන් වහන්සේ උපෝසතය කෙසේ විය යුතුදැයි  පැහැදිලිකරනව. අපද අද වැනි උතුම් පෝදිනක මෙම සූත්‍රයෙන් උපෝසතයේ යෙදෙන නිවැරදි ආකාරය ඉගෙනගැනීමට උත්සහවත් වෙමු. වෙසක් පෝදා සිල් සමාදන්වී උපෝසතයෙහි යෙදෙන ඔබට ඉතා වැදගත් පණිවුඩයක් මෙයින් ලැබේවි.

1.විශාඛාවෙනි ගෝපාලක උපෝසතය කෙසේද?

යම් විදියක ගවයන් බලන ගොපල්ලා හෙවත් ගවයන් බලාගන්නා පුද්ගලයන් සවසට ගවයන් ගව හිමියාට ගෙනවිත් බාරදෙනව. ඔහු කල්පනා කරනව අද අසුවල් අසුවල් තැන්වල හරකුන්ට කැව්ව අසුවල් අසුවල් තැන්වලදී වතුර පෙව්ව හෙට දවසෙදී කවන පොවන තැන් සිතනව. විශාඛාවෙනි ඒවගෙයි ඇතැමුන් පෙහෙවස යයි මෙසේ හිතනව මම

අද මේ මේ කෑම වගී කෑව බීම වගී බිව්වා හෙට දවසෙ මේ මේ ආහාර පාන ගන්නව යනුවෙන් ලෝභී වූ සිතින් (අභිධ්‍යාවෙන්) රස පිළිබඳ ආසාවෙන් දවස ගෙවනව. විශාඛාවෙනි මෙසේ ගොපලු පෙහෙවස හෙවත් ගෝපාලකූපෝසතය වෙයි.

මෙම උපෝසතය ආහාර පිළිබඳ හැඟීමෙන් පවතින පිළිවෙතක් පමණයි. අදත් විවිධ ආගම්තුල මේ ගොපලු පෙහෙවස ක්‍රියාත්මක වෙනව. දවසෙන් අඩක් නිරාහාරව ඉදීම විශේෂයෙන් එවැනි දිනවලදී උපවාසය අත්හැරීම, ආරම්භ කිරීම වැනි අවස්ථාවලදී  ගන්නා කැඳවගී විවිධ ආහාර වර්ග භාවිතා කිරීමද පවතිනව. ඔවුන්ගේ සිත තුල පවතින්නේ ලෝභයෙන් අභිධ්‍යා සහගත සිතින් යුතු මහත්ඵල නොවන මහා ආනිශංස නොවන පිළිවෙතක් ලෙසට බුදුරජාණන් වහන්සේ විශාඛාවට පෙන්වා දෙනව.

2.විශාඛාවෙනි, නිගණ්ඨූපෝසතය කෙසේද?

නිගණ්ඨ නම් මහණ පිරිසක් ඇත. ඔවුන් ශ්‍රාවකයින් මෙසේ මෛත්‍රියෙහි පිහිටුවයි ඔබලා නැගෙනහිර, බටහිර, දකුණ, උතුර යන දිසාවන්ට යොදුන් සියය බැගින් යම් පණ ඇති සතුන් වෙයිද ඔවුන් කෙරෙහි දඬුමුගුරු ආයුධ අත්හැර වාසය කරන්න. ඔවුන්ගේ මෛත්‍රියෙහි ඉන් එහා සතුන් ගැන හැඟීමක් නැහැ තවද පොහොය දිනට ශ්‍රාවකයන් මෙසේද සමාදන් කරවයි. එන්න ශ්‍රාවකයිනි! ඔබ හැම වස්ත්‍ර ගලවා තබා මෙසේ කියවඃ මම කිසිවෙකු සමග හෝ කිසිවක් සමග බැඳීමක් නැත ආසාවන් නැත වස්ත්‍රයද අත්හැරලයි ඉන්නෙ. එසේ වුවද විශාඛාවෙනි ඒ අය අතර මවුපියෝ අඹු දරුවෝ ආදී වශයෙන් බැඳීම් තියනව ඒ රාත්‍රිය ගතවනවාත් සමග ආයෙත් ඇදුම් ඇඳගෙන කනව බොනව බැඳීම් ඇති කරගන්නව ඥාති මිත්‍රකම් පවත්වනව මේ මුසාවාදයෙහි සහ අදත්තාදනයේ  සමාදනයයි මහත්ඵල නොවූ ආනිශංස නැති හරයක් නැති නිගණ්ඨ උපෝසතයයි.

3. විශාඛාවෙනි අරියූපෝසතය යනු කුමක් ද?  එය ඉගෙන ගන්න

එනම් කිලිටි වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වන පිළිවෙතයි. ඒ කෙසේද මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා තථාගතයන් වහන්සේ අනුස්මරණය කරයි (සිහිකරයි) භාග්‍යවතුන් වහන්සේ සියළු කෙළෙසුන් කෙරෙන් දුරු වූ සේක (අරහං) චතුරාර්‍ය්‍ය සත්‍ය දැන ගත් සේක. අනුන්ට අවබෝධ කරවන සේක (සම්මා සම්බුද්ධො) ප්‍රඥාවෙන් සහ සීලාදී ගුණයෙන් යුක්තවන සේක. (විජ්ජා චරණ සම්පන්නො) යහපත් ගමනින් සහ වචනයෙන් යුක්ත වන

සේක (සුගතෝ) ලෝකය දක්නා සේක (ලොකවිදු) කෙනෙකුට දමනය කළ නොහැක්කන් දමනය කළ සේක  (පුරිස දමම සාරථි) දෙව්මිනිසුන්ට ගුරුවූ සේක. (සතථා දෙවමනුසසානං) සත්‍ය අවබෝධ කළ සේක (බුදෙධා) භාග්‍යවත්ය (භගවා)

විශාඛාවෙනි තථාගතයන් වහන්සේ ගැන අවබෝධයෙන් මෙසේ  සිහිපත් කරන විට ඔහුගේ සිත පහදිනව ප්‍රමෝදය ඇතිවෙනව සිතෙහි යම් කිසි උපකෙල්ශයෝ (කිළුටු) පහළ වෙයිද ඒවා ප්‍රහාණය වෙයි. මේ සඳහා බුදු හිමියන් උපමාවක් දේශනා කරනව.

විශාඛාවෙනි, යමෙක්  කිලිටිවූ හිසෙහි ඇඹුල්, කල්ක, මැටි, වතුර සමග මිශ්‍රකර උත්සාහයෙන් අතුල්ලා සෝද පිරිසිදු කරයිද උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද ඒ පරිදි තථාගතයන් වහස්සේගේ අප්‍රමාන ගුණ ''අරහං'' ආදී වශයෙන් මෙනෙහි කිරීමෙන් සිතේ කිළිටි බව දුරුවී ප්‍රමුදිතවේ. එය බ්‍රහ්මූපෝසතයයි. සම්‍යක් සම්බුද්ධ සංඛ්‍යාත බ්‍රහ්මරාජයා සමග වාසය කිරීම වාගේය. විශාඛාවෙනි, කිලිටිවූ සිතේ පිරිසිදුවීම අප්‍රමාණ බුදුගුණ සිහිකිරීමෙන් එසේ සිදුවෙයි.

මේ ශාසනයෙහි ආර්යශ්‍රාවකයා අවබෝධයෙන් යුතුව ධර්‍මය මෙනෙහි කරයි භාග්‍යවතුන්වහන්සේ ධ

භාග්‍යවතුන්වහන්සේ ධර්‍මය අන්තදෙකට නොගොස් මැනවින් වදරා ඇත. (සවාකඛාතො) මේ ජීවිතයෙදීම තම සිතින් අවබෝධ කළ යුතුය. (සඥිටඨිකො) කල් නොයවා විපාක දෙන  කාලයට  අවලංගු නොවන (අකාලිකෝ) ඇවිත් විමසා බලන්න යයි කිවහැකි (එහිපසසිකො) තමා තුලින් දැකිය යුතු (ඕපනයිකො) නුවන ඇති අය තම තමන් විසින් අවබෝධ කරගන්නව  ( පචචතතං වෙදි තබෙබා විඤඤුහි)

ඒ සඳහා උපමාව වදරනව විශාඛාවෙනි මෙසේ දහම් ගුණ අවබෝධයෙන් සිහිකිරීම කිලිටි ශරීරය උපක්‍රමයෙන් හෝද පිරිසිදු කිරීම වගෙයි ශරීරය කෙසේ උපක්‍රමයෙන් හෝදයිද සුනු, නානු, ජලය (අද මෙන් සබන් ආදී ද්‍රව්‍ය එද තිබී නැත.) යොද වීයර්‍ය ගෙන කිලිටි ශරීරය සෝද පිරිසිදු කිරීම මෙනි. ඒ වාගේ කිලිටි සිත ධමමානුසසතිය කිරීමෙන් උපක්‍රමයෙන් පිරිසිදු වේ. ධර්‍මය අනුස්මරණය කරන ඔහුගේ සිත ප්‍රසන්නවේ ප්‍රමුදිතවේ සිතෙහි උපක්ලේශ පහවයයි. විශාඛාවෙනි මෙසේ කිලිටි වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වේ.

ඊලඟට බුදුරජාණන් වහන්සේ විශාඛාව අමතා පෝය දවසට උපෝසතයෙහි යෙදුනු ආර්‍ය්‍ය ශ්‍රාවකයා සංඝානුසසතියෙහි යෙදී ආර්‍ය්‍ය සංඝරත්නය සිහිපත් කරන විදි පෙන්වා දෙනවා. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා රාග දෙවශ මෝහ දුරුකිරීමේ ප්‍රතිපදවක් අනුගමනය කරනව (සුපටිපනෙනා) ඍජු පිළිවෙතකට බැස ගත් පිරිසකි. (උජුපටිපනෙනා) . ආර්‍ය්‍ය සත්‍ය අවබෝධ කිරීමේ න්‍යාය තුලයි වාසය කරනුයේ (ඤායපටිනෙනා) ඒ මග ගමන් කරමින් ඒ මග පිළිබඳව පිළිසඳරෙහි යෙදෙනව (සාමීචි පටි පනෙනා) ඒ ශ්‍රාවක සංඝයා වහන්සේ පුරුෂ යුග වශයෙන් සතරකි. පුද්ගල වශයෙන් අට දෙනෙකි. සිව්පසයෙන් පිදුම් ලැබීමට සුදුසුය (ආහුණෙයය) ආගන්තුක සත්කාර ලබන්නට සුදුසුය  (පාහුණෙයය) සැදැහැවතුන් දෙන දානය පිළිගැනීමට සුදුසුය.(දකඛිණෙයෙයා) දෙහොත් මුදුන් තබා වැඳීමට සුදුසුයි. (අඤ්ජලි කරණීයො) ලෝකයාට පුණ්‍ය බීජ වැපිරීමට කෙතය (පුඤඤකෙඛතතං ලොකසස) මෙසේ ශ්‍රාවක සංඝරත්නය අවබෝධයෙන් සිහිකරන ඔහුගේ සිත පැහැදෙනව ප්‍රමුදිත වෙනව එය හරියට කිලිටි වස්ත්‍රයක් උපක්‍රමයෙන් පිරිසිදු වෙනව වාගෙයි යනුවෙන් වදරනව

කිලිටි වස්ත්‍රයක් පිරිසිදු කිරීම සඳහා උණුවතුර, අළු ගොම, හුණු වැනි ද්‍රව්‍ය යොද ජලය උපයෝගී කරගෙන උපක්‍රමයෙන් වීයර්‍ය යොද හෝදනවා වගෙයි කියනව ආර්‍ය්‍ය සංඝරත්නය සිහිකිරීම එනම් සංඝානුස්සතිය වැඩීම එයින් සිතේ ප්‍රමෝදය ඇති වේ.

විශාඛාවෙනි ආයඨ් උපෝසතයෙහි යෙදෙන්නා ඊලගට සීලානුසසතියෙහි යෙදෙනව අනුන්ගෙ සීලය නෙව් තමන්ගෙ සීලය පිළිබඳව හරි අවබෝධයකිනුයි සිහිපත් කරන්නෙ. කඩනොවූ, සිදුරු නැති, පැල්ලම් නැති තම දිවිපැවැත්ම සිහිකරනව තණ්හා, දිට්ඨි, මාන යන තත්වයන්ට පත් නොවීමට සමාධිය පිණිස පවත්නා වූ තමාගේ සීලය මෙනෙහි කරනව එවිට සිතේ කිලිටි බව නැතිවෙනව හරියට මුණ බලන කණ්නාඩිය ක්‍රමයෙන් පිරිසිදු කරනව වගෙයි. තෙල්, අලු සහ පිසදමන උපකරණය අරගෙන උත්සාහයෙන් කැටපත පිරිසිදු කිරීමට උපමා කරනව. එවිට ඔහුගේ සිත පැහැදේ. ප්‍රමුදිතවේ සිතේ කිලිටි බවට හේතුවන කෙළෙස් ප්‍රහීනවෙයි.

සීලය කෙසේවිය යුතුද සිත පිරිසිදු ප්‍රමුදිතවන ආකාරයටය (අඛණ්ඩානි) මුල මැද සිල් පද නොකඩාගත් බවයි. (අච්ඡිද්‍රනි) මැදින් සිල් පද නොකඩා ගත් බවයි. (අසබලානි) පිළිවෙළින් සිල්පද කීපයක් කඩා නොගැනීමෙන් සීලයෙහි කබර වැනි පැල්ලම් ඇති කර නොගැනීම (අකමමාසානි) කොටි හමක තිත් මෙන් අතරින් පතර සිල්පද කඩා නොගැනීම (භුජිසසානි) තණ්හා දස බාවයෙන් මිදුනු (විඤ්ඤුපපසතත) නුවනැත්තන් විසින් ප්‍රසංසා ලබාදෙන බව (අපරාමට්ඨ) තණ්හා දිට්ඨි මාන යන කරුණු තුනෙන් කිලිටි නොවීම (සමාධිසංවතතනිකානි) ලෞකික ලෝකෝත්තර සමාධි ලාභයට හේතු වන බවයි. මෙසේ වූ සීලය සිහිකරන්නාට ඊට වඩා සැපතක් නැත.

විශාඛාවෙනි ආයඨ් උපෝසතයෙහි යෙදෙන ශ්‍රාවකයා ඊලගට දේවතානුස්සතියෙහි අවබෝධයෙන් යෙදෙයි. චාතුර් මහා රාජිකයෙහි දෙවියො ඇත. ඒ ආදී වශයෙන් තව්තිසා දෙව්ලොව, යාම දෙව්ලොව, තුසිත දෙව්ලොව, නිම්මානරතී දෙව්ලොව පරනිම්මිත වසවත්ති දෙව්ලොව දෙවියො ඇත. බ්‍රහ්මලෝකවාසී බ්‍රහ්ම දේවතාවන් ඇත. ඉන් ඔබ්බෙහිද දෙවියන් බ්‍රහ්මයන් ඇත ඒ දෙවියන් මිනිස් ලොව වූ මෙහි සිට යම්කිසි ශ්‍රද්ධාවක් පහළකර ගෙන වාසය කොට මරණයට පත්වී දිව්‍යලෝකයෙහි උපන්නේද එමෙන්ම මමද අද වාසය කරන්නේ එසේ වූ ශ්‍රද්ධාවකින්යයි මට හැගේ යනුවෙන් දෙවියන් පිළිබඳව මෙනෙහි කරනවා. එය නිවැරදිව මිත්‍යාවෙන් තොරව සිතමින් තම සීලය තුලින් දෙවියන් දකිනවා. සීලයෙන් තොරවූ දේවත්වයක් නැති නිසා මෙසේ මෙනෙහි කළ යුතුය.

එබැවින් යම්කිසි සීලයකින් යුක්තව, යම් ශ්‍රාවකයෙකු වාසය කොට මෙයින් මරණයට පත්වී එම දිව්‍ය ලෝකයන්හි උපන්නාහුද එබඳු සීලයකින් තමයි අද මම පසු වෙන්නෙ

ඊලගට බුදුහාමුදුරුවෝ පැහැදිලි කරනව යමෙක් යම්කිසි ශ්‍රැතයකින් හෙවත් ධර්මය අසා දැනගෙන බොහෝ ඇසු පිරු තැන් ඇතිව යම් පමණකට ධර්මය දැන ඉගෙන මෙහිදී මරණයට පත්වී එම දිව්‍යලෝකයන්හි උපන්නාහුද මමද එවැනි ශ්‍රැතවත් භාවයක් ඇති කරගනිමිනුයි වාසය කරන්නේ

එමෙන්ම යමෙක් ත්‍යාගී සවභාවයකින් මෙහි වාසය කොට මරණයට පත්වී දෙව්ලොව පහළ වූයේද මම ද ඒ ආකාරයේ ත්‍යාගී භාවයකින් තමයි අද වාසය කරන්නේ

එමෙන්ම යම් ශ්‍රාවකයෙකු යම් කිසි ප්‍රඥාවකින් යුක්තව මෙහි වාසයකොට මරණයට පත්වී මෙහිදී චුතව දෙව්ලොව උපදීද මටද එබඳුවූ ප්‍රඥාවක් ඇතැයි විද්‍යාමානව දැනෙයි. ඒ අනුව වාසය කරමි.

මෙසේ ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන කරුණු පහ අනුව දේවතානුසසතියෙහි යෙදෙන තෙරුවන් සරණගත ශ්‍රාවකයාගේ සිත ප්‍රසන්න භාවයට පත්වෙයි. ප්‍රමුදිතභාවයට පත්වේ. සිතෙහි යම් කහටක් කිලුටක් වේ නම් එය ප්‍රහීන වෙයි. මෙහිදී බුදුපියාණන් වහන්සේ පෙන්වා දෙන දේවතානුසසතිය පිළිබඳව අප වඩාත් සිත යොමු කළ යුතුය. මන්දයත් ත්‍රිවිධරත්නය අවබෝධයෙන් සරණ ගියානම් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පෙන්වාදෙන දිව්‍යලෝක බ්‍රහ්ම ලෝක පිළිබඳ විග්‍රහය සත්‍ය බවට පිළිගත යුතුය.වෙනත් දේව පිළිගැනීම් වෙනත් ආගමික මත අත්හළ යුතුය. දෙවියන් පිළිබඳව අප දන්නේ මොනවාදැයි දැනුමක් එයින් ලැබේ. අපේ උපෝසතය නිවැරදි වේ. විශාඛා ආයෂීාවට බුදුරජාණන්වහන්සේ මේ දේශනාව සිදුකරන්නෙ එතුමිය සොතාපන්න උත්තමාවියක් බවද දැනගෙනය සැකය එතුමියට නැත. විචිකිච්ඡාව හෙවත් සැකය තිබුනා නම් විශාඛා ආයෂීාව මේවා පිළිනොගන්න ඉඩතියනව එතුමිය බුදුරජාණන් වහන්සේ පිළිගත් කෙනෙකි.

ඊලගට බුදුරජාණන් වහන්සේ උපමාවෙන් පැහැදිලිකරනව මෙසේ දෙවියන් පිළිබඳ සිහිකරණ ශ්‍රාවකයාගේ සිත ප්‍රමුදිත භාවයට පත්වෙන්නෙ රත්‍රන් පිරිසිදුකරන පුද්ගලයා රත්‍රන් උපක්‍රමයෙන් පිරිසිදු කරනවා වාගෙයි කියල රන්රිදී පිරිසිදුකිරීමෙන් එහි බැබලීමක් එනව ඒ සඳහා ඔහු උපක්‍රමයොදනව උදුන, ලුනු, අඬුව, රසායනික ද්‍රව්‍ය, වෙනත් උපකරණ හා ඔහුගේ වීයෂී මේ සඳහා හේතුවෙනව විශාඛාවෙනි මේ සාසනයේ ආයෂී ශ්‍රාවකයා දෙවියන් නිවැරදිව අවබෝධයෙන් සිහි කරනව එවිට ඔහුගේ සිත ප්‍රමුදිත වෙනව පිරිසිදු වෙනව එවිට එය ආයෂී ශ්‍රාවක දේව

පිරිසිදු වෙනව එවිට එය ආයෂී ශ්‍රාවක දේවතූපෝසතය වෙනව දෙවියන් සමග වාසයක් බවට පත්වෙනව දෙවියන් නිසා සිත පහදා ගන්නව එය නිවැරදි සිත පිරිසිදු කර ගැනීමය. අද අපේ රටේ දෙවියන් පිළිබඳව ඇතැමුන් සිතන ආකාරයට සිත ප්‍රමුදිතවීමක් සිදුවේ ද? යයි දහමට අනුව සිතිය යුතුය.

නැවත බුදුහිමියන් විශාඛාවට පැහැදිලිකරනව ආයෂී උපෝසතයේ යෙදෙන ශ්‍රාවකයා මෙසේ සිතනව යනුවෙන් රහතන් වහන්සේලා අනුගමනයෙන් සිත පිරිසිදු කරගන්න විදි රහතන් වහන්සේලා දිවිහිමියෙන් දිවා රෑ ප්‍රාණ ඝාතයෙන් වලකිනව ඒ සඳහා උදව් දෙන්නේ නැහැ සියළු සතුන් කෙරෙහි හිතානු කම්පීව වාසය කරනව මේ ගුණාංගයෙන් මම අද රහතන් වහන්සේ අනුගමනය කරනව එවිට මට නිවැරදි උපෝසතය වෙනව " ඉමිනා පහං අඩෙගන අරහතං අනුකරොමි " මම ඒ ආකාරයෙන් රහතන් වහන්සේලා අනුගමනය කරමි.

(පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

ඊලගට බුදුහාමුදුරුවො විශාඛාවට පැහැදිලි කරනව රහතන් වහන්සේලා දිවිහිමියෙන් නුදුන් දේ ගන්නෙ නැහැ මේ දවාලත් රාත්‍රියත් දුන්නු දෙයක් ගන්නා සවභාවයෙන් නොසොරවූ පවිත්‍ර ආත්මයක් ඇතිව වාසය කරමි. ඒ නිසයි අටසිල් සමාදන් වූ විට කෙනෙක් පිළිගැන්වූ දේ පමණක් පරිභෝජනය කරන්නෙ භික්ෂූන් වහන්සේලාගේ සීලයට අනුව උන්වහන්සේලා දිවිහිමියෙන් මෙසේ ඒ සීලය රකිනව.

(අදිනනාදනා වෙරමණි සිකඛාපදං සමාදියාමි)

රහතන් වහන්සේ දිවිහිමියෙන් අබ්‍රහ්ම චර්යාව හැර දමා බ්‍රහ්ම චයෂීාවෙන් වාසය කරනව මේ දිවා රාත්‍රියෙන් යුක්ත දවස මමද ග්‍රාම්‍ය වූ හීනවූ අබ්‍රහ්ම චයෂීාවෙන් වෙන්ව (ස්ත්‍රී පුරුෂ සම්භෝගයෙන් වෙන්ව) රහතන් වහන්සේ අනුගමනය කරමින් මාගේ උපෝසතය ඒ ගුණාංගයෙන්ද සම්පූර්ණ කරමි.

(අබ්‍රහමචරියා වෙරමණි සිකඛාපදං සමාදියාමි)

රහතන් වහන්සේලා දිවිහිමියෙන් මුසාවාදයෙන් වැළකුණාහුය. සත්‍ය පමණක් භාවිතා කොට සත්‍යයෙන් සත්‍ය මතුකොට ස්ථිර වූ ඇදහිය හැකි කථා ඇත්තාහුය. ලෝකය හිංසාවට පත් නොකළාහුය. මමද මේ දිවා රාත්‍රිය බොරුව හැරදමා ඇදහිය හැකි සත්‍ය පමණක් භාවිතා කොට ලෝකයා හිංසාවට පත් නොකරමි. ඒ ගුණාංගයෙන්ද රහතුන් අනුගමනය කොට " උපොසතො ච මෙ උපවුතෙථා" මාගේ උපෝසතය සම්පූර්ණ කරමි.

(මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

මහරහත් උතුමන් දිවිහිමියෙන් මත් ද්‍රව්‍යවලින් සම්පූර්ණයෙන්ම වැළකුණෙන් මමද ඒ ආකාරයෙන් මදයට හා ප්‍රමාදයට හේතු වන යම් මත්වන ද්‍රව්‍යක් වෙත්ද එයින් වලකිමි. යනුවෙන් ආර්‍ය්‍ය උපෝසතයට අනුව වාසය කරනව මේ ගුණාංගයෙන්ද මාගේ උපෝසතය සපුරමි

(සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

ඊලගට බුදුහිමියන් විශාඛාවට පැහැදිලිකරනව ආර්‍ය්‍ය ශ්‍රාවක වූ රහතන් වහන්සේලා මෙන් උපෝසතයෙහි පිහිටන පුද්ගලයා ආර්‍ය්‍ය උපෝසතය තමාතුලද පිහිටුවා ගැනීමට රහතන්වහන්සේලා දිවිහිමියෙන් විකාල භෝජනයෙන් වැලකී "එක භතතික" හෙවත් උදේ වරුවේ පමණක් ආහාර ගැනීමෙන් රාත්‍රී භෝජනයෙන් වැළකුනාහුය. මමද මේ දවස (දිවා රාත්‍රී) විකල් භෝජනයන්ගෙන් දුරු වූ කෙනෙකු වෙමි. එවිට මටද ආර්‍ය්‍ය ශ්‍රාවක උපෝසතයෙන් යුතු කෙනෙකු වීමට ඒ ගුණාංගය අවබෝධයෙන් අනුකරණය කරමි.

(විකාල භොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

රහතන් වහන්සේද දිවිහිමියෙන් නැටුම් ගැයුම් වැයුම් විකට දර්ශණ දැකීමෙන් මල් සුවඳවිලවුන් ආදියෙන් සැරසීම යන කාරණයෙන් වැළකුණාහුය. මමද අද මේ දිවා රාත්‍රී දෙකින් යුක්ත වූ දවස ඒ ගුණාංගය අඩු නොකොට සපුරමි. එවිට මටද ආර්‍ය්‍ය පෙහෙවස හෙවත් උපෝසතය සිදුවේ.

(නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

අටවෙනි කාරණය ලෙසට භාග්‍යවතුන්වහන්සේ මෙසේ විශාඛාවට දක්වනව රහතන් වහන්සේද දිවිහිමියෙන් සුඛෝපභෝගී වූ ආසන මහා ආසන ආදියෙන් වැළකුණාහුය. මමද මේ දිවා රාත්‍රී දෙකින් යුක්ත දවස ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක උතුමන්ගේ එම ගුණාංගයද අනුකරණය කරමි එයින් මට උපෝසතය සිදුවේ.

(උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි)

විශාඛාවෙනි මෙසේ ආර්‍ය්‍ය උපෝසතයෙහි යමෙක් යෙදේ නම් ඔහුට මහත්ඵල වෙයි. මහත්ඵල යනුවෙන් දැක්වූයේ සතරමග සතර ඵලය බව අප විසින් දත යුතුයි. මහා ආනිශංසවෙයි මහා බැබලීමක්ද වෙයි මහා පැතිරීමක්ද වෙයි ඒ මහත්ඵල ආදියෙහි බලවත්කම කොපමණද? යන්න පහත දැක්වෙන උපමාවෙන් පෙන්වා දෙනව එය ඉතා මනහරලෙස බුදුනුවනින් දැන වදාරණව.

විශාඛාවෙනි යම් විදියකින් මේ දඹදිව් තලයෙහි පිහිටි අඩුවක් නැතිව සත්රුවනින් පිරි සොළොස් මහා ජනපදයන්ගේ අධිපතිකමින් යමෙක් රජපත්වේද ඒ රාජ සම්පත්තිය අංග අටකින් යුතු මේ උපෝසතයෙහි ආනිශංසයෙන් දහසයෙන් පංගුවක්තරම්වත් ඉහතකී රාජසම්පත් අගය කළ නොහැකිය. හේතුව? දිව්‍ය ලෝකවල ඇති සම්පත් ලැබීමට උපෝසතයේ ආනිශංසයෙහි ශක්තිය ඉහත කී මිනිස් රාජ සම්පත් තුලින් ලැබිය නොහැකි

නිසාය. මිනිස් රාජ සම්පත් අල්ප වූ දෙයකි. ඉහතකී කාරණය තහවුරු වීමට විශාඛාවට බුදුහිමියන් පැහැදිලි කරනව දිව්‍ය සම්පත් පිළිබඳ බුදුනුවනින් දුටු සත්‍ය සවභාවය ඒ පිළිබඳව මෙහි සාරාංශ වශයෙන්වත් සටහන් වීම වටහාගැනීමට පහසුවක් වනු ඇත.

1. විශාඛාවෙනි මිනිස් ලොව ආයුෂයෙන් අවුරුදු පනහක් චාතුර් මහාරාජික මහා දෙවියන්ට එක රැයක් සහ දවාලකි. එයින් තිස් දවසක් මාසයකි. එයින් මාස දොළහක් අවුරුදු එකකි. එයින් අවුරුදු පන්සියයක් චාතුර් මහාරාජික දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණයවේ. විශාඛාවෙනි, යම්කිසි විදියකින් යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු අංග අටින් යුතු ආයර්‍යන් වහන්සේලා පැසසූ උපොසතයෙහි යෙදී යම්දිනක මරණයට පත්වේ. ඔහු හෝ ඇය චාතුර් මහා රාජික දෙවියන් අතර උපදී ඒ කාරණය එලෙසින්ම සිදු වේ. මේ දිව්‍ය සම්පත් සඳහා මිනිස් රාජ්‍යය ඉතා අල්පය උපෝසත ආනිශංසය බලවත්ය. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ආකාරයට අනෙක් දිව්‍යලෝකයන්හි ආයු ප්‍රමාණය සහ දිව්‍ය සම්පත්හි බලවත්කම පැහැදිලි කරනව.

2. විශාඛාවෙනි මිනිස් ලොව වර්ෂ සියයක් තව් තිසා දෙව්ලොවට එක් දවසක්. එයින් තිස් දවසක් මාසයකි. එයින් දෙළොස්මසක් අවුරුදු එකකි. එම වර්ෂ ගණනින් වර්ෂ දහසක් තව්තිසා වාසී දෙවියන්ට ආයුෂ ප්‍රමාණය වෙති.

3. විශාඛාවෙනි මිනිස්ලොව ආයුෂ ප්‍රමාණයෙන් වර්ෂ දෙසීයක් යාම දෙව්ලොව දෙවියන්ට එක් රැයක් සහ දවාලක් සහිතවූ එක් දිනකි. එයින් දින තිහක් මාස එකකි. එයින් මාස දෙළහක් අවුරුදු එකකි. එම අවුරුදු දෙදහසක් යාම නම් දෙව්ලොව දෙවියන්ගේ ආයු ප්‍රමාණය වෙති.

4. විශාඛාවෙනි, මනුෂ්‍ය ලොව වර්ෂ ගණනින් අවුරුදු හාරසියයක් තුසිත දෙව්ලොව දෙවියන්ට එක් දවසකි. එයින් තිස්දවසක් මාසයකි. එම මාස දෙළහක් තුසිත දෙවියන්ට අවුරුදු එකකි. එම අවුරුදු හාරදහසක් තුසිත දෙවියන්ගේ ආයුෂ වෙති.

5. විශාඛාවෙනි, මනුෂ්‍ය ලොව වර්ෂ අටසියයක් නිර්මාණරතී නම් දෙව්ලොව දෙවියන්ට එක් දවසකි. එම තිස් දිනක් මාසයකි එයින් මාස දෙළහක් අවුරුදු එකකි. එම අවුරුදු අට දහසක් නිර්මාණරතී දෙවියන්ගේ ආයුෂ වෙති.

6. විශාඛාවෙනි, මනුෂ්‍ය ආයුෂයෙන් එක්දහස් හයසිය වර්ෂයක් පර නිර්මිත වශවර්ති නම් වූ දිව්‍ය ලෝකයෙහි දෙවියන්ට එක දවසකි. එයින් දින තිහක් එම දෙව්ලොවට මාස එකකි. එයින් වර්ෂ දහසය දහසක් වර්ෂ පරනිර්මිත වශවර්ති දෙවියන්ගේ ආයුෂවෙති.

බුදුරජාණන් වහන්සේ මෙසේ දිව්‍ය ලෝක හයෙහි ආයුෂ පිළිබඳ විවරණයක් විශාඛා මහා උපාසිකාවට පැහැදිලි කළා. ඒ හැම දිව්‍ය සැප පිළිබඳ කාලය දැක්වූ භාග්‍ය වතුන් වහන්සේ විශාඛාවෙනි මෙලොව යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අංග අටින් යුතු පෙහෙවස් සමාදන් වීමට හුරු පුරුදු වන්නේද ඔහු මරණින් මතු ඒ ඒ චේතනා අනුව උසස් උසස්වූ පරිදි ඒ ඒ දෙව්ලොව දිව්‍ය සම්පත්තීන්ට හිමිකරුවෙක් වී දෙව්ලොව උපත ලබන බව වදාරණව. ඒ දිව්‍ය සම්පත් සඳහා මනුෂ්‍ය සම්පත් ඉතා අල්ප වුවද පෙහෙවස් ආනිශංසයම උසස් වන බව දක්වනව දෙව්ලොව දිව්‍ය සම්පත් දිහා බලනකොට අප මේ මිනිස් ලොව අගය කරන මනුෂ්‍ය සැප ඉතා දුප්පත් හිඟා කෑමක් ලෙසට වැටහෙනු ඇත.

එදා දඹදිව පැවති ඉතා සැපයෙන් පිරි ජනපද දහසයෙහි රාජ්‍ය ලබාගන්නවාට වඩා එක දවසක උපෝසත සීලයේ ආනිශංස ඉතා වටින බව මහාකරුණියන් වහන්සේ සියළු ලෝක සත්වයාට දැනගැනීමට මගඵල ලාභී සෝතාපන්න විශාඛා මහා උපාසිකාවට දේශනා කරනව.

අද වෙසක් පුර පසළොස්වක පෝය දිනය නිසා බොහෝ විහාරස්ථානවල අටසිල් සමාදන්වූ වාසනාවන්ත පිරිස මේ දහම් පණිවුඩය හොඳට හිතට ගතයුතුය එදා භාග්‍යවතුන්වහන්සේ පහළවූ යුගයෙත් උපවාස ක්‍රම පැවතිල තිබූ බව මේ සූත්‍රය ආරම්භයේදීම දැක්වෙනව භාග්‍යවතුන්වහන්සේ විශාඛා මහා උපාසිකාව අරබයා මේ සූත්‍රය දේශනා කරන්නෙ ආර්‍ය උපෝසතය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා දීමටය .

අදත් ඉන්දියාවේ පමණක් නොව අපේ රටෙත් එක් එක් ආගම් අදහන ජනතාව විවිධ උපෝසත ක්‍රම අනුගමනය කරනව ඒවා බොහෝ දුරට ආහාර සඳහා සීමාකරගත් ක්‍රමවේදයන් බව පැහැදිලි වෙනව ඒවා බුදුපියාණන් වහන්සේ ගෝපාලක උපෝසතය ලෙසට පෙන්වා දෙනව නිගණ්ඨ උපෝසතය එමනමින් සිටින ශ්‍රමණයන්ගේ ක්‍රියාවක් "අත්ථිවිශාඛෙ නිගණ්ඨා නාම සමණජාතිකා" ඒ ඇත්තන් ගේ උපෝසතය. නිශ්ඵල ලෙස ලෙස බුදුහිමියන් පෙන්වා දෙනව.

ආර්‍ය උපෝසතය, භාග්‍යවතුන් වහන්සේ අගයකරනුයේ මිනිස් සිත ශක්තිමත් කොට මෙළොව පරලොව සැපදයක තත්වයට පත්කිරීමත් සසර දුක් කෙළවර කිරීමත් නිසාය. "උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති" කිලිටිවූ සිත පිරිසිදු කිරීම උපක්‍රමයෙන් වෙයි. සිතේ පිරිසිදු බව උපක්‍රමයෙන් ඇති කිරීම අටසිල් සමාදන්වී රඟපෑමෙන් තොරව නින්දට සහ දනයට සීමා නොකරසැබෑවටම දවස ගතවනවාත් සමග ඒකාන්තයෙන්ම සිදුවනබව වදාරනව .

ඊලගට දේවතානුස්සතිය හෙවත් දෙවියන් පිළිබඳ නිවැරදිව මෙනෙහි කිරීමයි. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ විසින්ම දෙවියන් බවට පත්වන ආකාරය. දිව්‍යලෝකයන්හි සවභාවය දේශනාවෙහිම දක්වා ඇත. එසේ දෙවියන් පිළිබඳ මෙනෙහි කිරීමෙන් සිත ප්‍රමුදිතවේ. එය වරදවා තේරුම්ගත් පිරිස් දෙවියන් පිළිබඳව මිත්‍යා ආකල්ප දරණුයේ මිල කල නොහැකි දහම නොදැනීම නිසාය . එය ශාස්තෘන්වහන්සේටද කරන අගෞරවයකි. දේවතානුස්සතිය සඳහා කිසිදු අගයක් නැති තුට්ටු දෙකේ මුලාවීම් වෙහෙසවීම් අවශ්‍ය නොවේ. මේ දේශනාව ඒ සඳහා හොඳින් උපදෙස් දෙනව සිත නිවැරදි කරනව.

ඒ අනුව උපෝසත තුන තේරුම් ගත්ත සිත පිරිසිදු කරන ආකාර අනුස්සති පහම තේරුම් ගත්ත ඊලගට සීලයෙන් රහතන්වහන්සේලා අනුකරණය කරන විදි තේරුම් ගත්ත "ඉමිනා පහං අඩෙගන අරහතං අනුකරොමි" රහතන් වහන්සේලා අනුකරණය කරමි.

අද අපේ රටේ අටසිල් සමාදන් වීම කාලයාගේ ඇවෑමෙන් දවසෙන් භාගයකට සීමා වෙලයි තියෙන්නෙ සමහර ඇත්තන් ඒ වරුවත් දානය වැළඳීමට සහ නිදා ගැනීමට යොදනවා සමහරු වෙනත් වෙනත් ආමිස පුජාවන්ටම තැන දී ඇත. ආමිසය නොකළ යුතු දෙයක් යැයි මෙහි දක්වනවා නොව තෙරුවන් සරණ ගිය කුඩා දරුවාට වුවද මේ සූත්‍රයට අනුව ආර්‍ය උපෝසතය හුරු කළ යුතුය කුඩා කළ පටන් සිතෙහි පිරිසිදුකම අත්‍යාවශ්‍ය හෙයිනි නැතහොත් ඔවුන් වයස මුහුකුරා යද්දී දෙමාපියන් මැරීමට තරම් සිත දූෂිත වනු ඇත. ජීවිතයේ එක දවසක් හෝ ඒ සඳහා පුහුණුවක් ලැබිය යුතුය. බෞද්ධ ගිහි කෙනෙකු මැරුණම ඒ මළකඳට සිල් ඇඳුම අන්දවනව අප කෙනෙකුත් දැක ඇත. එනමුත් ඔහුගේ හෝ ඇයගේ සිතට කිසිදිනක සීලය ලබා දී නැත. අවසානයේ ලෝක අපවාදයෙන් මිදීමට මල්ශාලාවේ පිහිටෙන් උතුරු සළුව පෙරවා ආදාහනය හෝ භූමිදානය කරති. එවිට ගෝපාලක උපෝසතය වත් එතැන නැත.

අද අපි සම්බුදු තෙමගුල සමරණවා යැයි මොනවාද කරන්නෙ කියල කල්පනාවට ගතයුතුයි, අද සිදුකරන වෙසක් සැණකෙළි දුටුවිට සිතනුයේ ඒ සැණකෙළි සිදුකිරීමට බුදුවරු පහළ විය යුතුමද? යන්නයි. බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙන්නේ කුමකටද? බුදුරජාණන් වහන්සේලා සංසාර ගමන දුකක් බව පෙන්වා දෙනව, නිවීමේ අගය පෙන්වා දෙනව ගිහි ජීවිතය ගත කරන ශ්‍රාවකයින්ට සුගතියේ සිත පිහිටුවා ගන්නත් ධර්මයේ හැසිරී නිවන් දැකීමටත් තමයි මගපෙන්වා දෙනුයේ උන්වහන්සේ මේ සූත්‍රයෙන් විස්තර කරන්නෙ ඒ සඳහා සිත පිරිසිදු කරන ආකාරයයි ඒ ආකාරයට ආර්‍ය්‍ය උපෝසතය පිළිගන්න අද අදම උනන්දුවිය යුතුය. අනුස්සති භාවනා පුරුදු කොට අර්ථයක් ඇති ආකාරයට පෝද උපෝසතය ඇති කර ගැනීමට මේ දේශනාව උපයෝගී කරගත යුතුයි.ආර්‍ය්‍ය උපෝසතය පිළිගෙන හැකිතාක් සිත පිරිසිදු කරගත යුතුයි. එසේ නොවුවහොත් සීලයේ අඩුකම නිසා දුගතියේ උපදින්න සිදු වෙනව ඉන්පසු කල්පගනනකට ආර්‍ය්‍ය ධර්මය කණින් ඇසීමටවත් නොලැබේවි. උතුම් ආර්‍ය්‍ය උපෝසතයට නැඹුරුව සසර දුක් නැසීමට මේ වෙසක් පුර පොහෝදින අධිෂ්ඨාන කරගනිමු.